ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
கமநல அபிவிருத்தித் திணைக்களம்
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

මගේ අංකය / எனது இல. / My No. 7/3/14/Ca/Co/Pa/Fi/2021 (09)    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2021.07.17

චක්‍රලේඛ අංකය : 07/2021

සියලුම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරුන් වෙත,

**වී හෝ වෙනත් බහුවාර්ෂික නොවන බෝග වගාකළ නොහැකි කුඹුරු ඉඩමක 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 30(3) වගන්තිය ප්‍රකාරව පොල් වගා කිරීම සඳහා අවසර ලබාදීම.**

ශ්‍රී ලංකාවේ සියලුම කුඹුරු ඉඩම් කෘෂිකාර්මික ප්‍රතිපත්ති වලට අනුකූලව, ඉඩමේ ප්‍රමාණය, පිහිටීම සහ ස්වාභාවික සම්පත් සැලකිල්ලට ගෙන ඉතාම ගැලපෙන බෝග වර්ගය මනා ඉඩම් කළමනාකරණයක් තුළින් කාර්යක්ෂමව වගා කිරීමෙන් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමේ අරමුණින් වී වගා කිරීමට නොහැකි එහෙත් පොල් වගා කිරීමට යෝග්‍ය බවට හඳුනාගනු ලබන කුඹුරු ඉඩම් ඵලදායිව ඒ සඳහා යොදා ගැනීමට අවස්ථාව ලබා දීම පිණිස මෙම චක්‍රලේඛය නිකුත් කරමි.

2. දේශීය පරිභෝජනයට අවශ්‍ය පොල් හා ආශ්‍රිත නිෂ්පාදන ආනයනය සීමාකර පොල් කර්මාන්තය නගාසිටුවීම සඳහා මෙම අවසර ලබාදීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක වන අතර අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීම සඳහා පූර්ණ විනිවිදභාවයෙන් යුතුව මේ සඳහා කටයුතු කළ යුතුය.

3. කුඹුරු ඉඩම් වල පොල් වගා කිරීම සඳහා ඉඩම් හඳුනාගැනීම සහ අවසර ලබාදීම සම්බන්ධ නිර්ණායක/ කොන්දේසි සහ ක්‍රමවේදය පහත පරිදි වේ.

(i) කුඹුරු ඉඩම් වල පොල් වගා කිරීමට අදාළ වන නිර්ණායක/ කොන්දේසි

(a) කුඹුරු ඉඩමේ නිරවුල් අයිතිය ඉල්ලුම්කරු සතුවිය යුතුය.

(b) කුඹුරු ඉඩමේ හවුල් අයිතියක් තිබේ නම් හවුල් අයිතිය බෙදා වෙන්කර ගත යුතුය. නැතහොත් හවුල්කරුවන්ගේ ලිඛිත කැමැත්ත හෝ එකඟතාවය නීත්‍යානුකූලව ලබා ගත යුතුය. බුක්තිය සම්බන්ධයෙන් යම් ඉඩමක ආරවුලක් පවතින අවස්ථාවක එම ආරවුල නිරාකරණය කිරීමෙන් පසුව ඉල්ලීම කළ යුතුය.

(c) කොන්දේසි වලට යටත්ව යම් කුඹුරු ඉඩමක බුක්තිය හෝ අයිතිය පවරා ඇති රජයේ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු හෝ වෙනත් රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක් සතු ඉඩමක් සම්බන්ධයෙන් වන විට ඒ සඳහා අදාළ ආයතනයෙන් පොල් වගා කිරීම සඳහා විධිමත් අවසරය සහිත ලිපියක් ලබා ගත යුතුය.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ.පෙ. 537, කොළඹ 07.
கமநல அபிவிருத்தித் திணைக்களம், இல. 42, சேர் மார்கஸ் பெர்னாந்து மாவத்தை, அ.பெ. 537, கொழும்பு 07.
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT, No. 42, SIR MARCUS FERNANDO MAWATHA, P.O. BOX. 537, COLOMBO 07.
දුරකථන/ தொலைபேசி/ Telephones :
පොදු කාර්යාලය / பொது அலுவலகம் / General Office: 011 2694231, 011 2694232, 011 2694233, 011 2694234
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් / கமநல அபிவிருத்தி ஆணையாளர் நாயகம் / Commissioner General of Agrarian Development: 011 2691060
ෆැක්ස් / தொலை நகல் / Fax: 011 2693572, 011 2691843, 011 2674481
E - mail : commissionerdad@yahoo.com
විදුලි පණිවුඩ / தந்தி / Telegram: ගොවිජනසේවා / கொவிசேவா / Agraservis

(d) අඳ ගොවියකු සිටින කුඹුරක් සම්බන්ධයෙන් පොල් වගා කිරීම සඳහා ඉල්ලීමක් ලැබී ඇති අවස්ථාවක 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.

(e) පොල් වගා කිරීම සඳහා ඉල්ලුම් කරන කුඹුරු ඉඩම අනුයාත වගා කන්න10 ක් (අවුරුදු 05ක්) හෝ ඊට වැඩි කාලයක් පුරන්ව පැවතිය යුතුය.

(f) පොල් වගා කිරීම සඳහා ඉල්ලුම් කරන කුඹුරු ඉඩම වී හෝ වෙනත් බහුවාර්ෂික නොවන කෘෂිකාර්මික බෝග වගා කිරීමට යෝග්‍ය නොවන බවට සහ පොල් වගා කිරීමට යෝග්‍ය බවට මෙම චක්‍රලේඛය මගින් පත් කර ඇති ප්‍රාදේශීය කමිටුව විසින් නිර්දේශ කළ යුතුය.

(g) පොල් වගා කිරීම සඳහා අවසර ලබාදෙන කුඹුරු ඉඩමක වගා කිරීමට බිම් සකස් කිරීමේ දී හෝ වගාව පවත්වාගෙන යන අතරතුර අදාළ ඉඩමෙන් පස් ඉවත් කිරීම හෝ පිටතින් පස් ගෙනැවිත් දැමීම සිදු නොකළ යුතු අතර එසේ අවශ්‍ය වන්නේ නම් මාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගත යුතුය.

(h) වී හෝ වෙනත් බහු වාර්ෂික නොවන කෘෂිකාර්මික බෝග වගා කරන කුඹුරු යායක් තුළ පවතින හෝ එවැනි කුඹුරු යායකට මායිම් ව පවතින කුඹුරු ඉඩමක් නම් ප්‍රදේශයේ ගොවි සංවිධානයේ එකඟතාවය සලකා බැලිය යුතුය.

(i) පොල් වගාව සඳහා අවසර ලබාදෙන ඉඩම වෙනත් කාරයක් සඳහා යෙදවිය නොහැකි අතර ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අවසර දෙනු නොලැබේ.

**(ii) <u>කුඹුරු ඉඩම් වල පොල් වගා කිරීමට අවසර ලබාදීමේ ක්‍රමවේදය</u>**

ඉහත නිර්ණායක/ කොන්දේසිවලට එකඟ වන යම් තැනැත්තෙක් කුඹුරු ඉඩමක පොල් වගා කිරීමට අවසර ඉල්ලා සිටින අවස්ථාවකදී පහත පියවරයන් අනුගමනය කර අවසර ලබාදීමට කටයුතු කළ හැකිය.

**1 පියවර**

මේ සමඟ ඇති PL/COC/01 ආකෘතියට අනුව අයදුම්පත්‍රයක් ඉඩම අයත් වන ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් රුපියල් 500.00ක මුදලක් ගෙවා ලබා ගැනීම.

**2 පියවර**

අයදුම්පත්‍රයේ 1 කොටස අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුය. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය අදාළ ලිපි ලේඛනවල සහතික පිටපත් සමඟ පිටපත් දෙකකින් අයදුම්පත්‍රය ලබාගත් ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත විධිමත්ව භාරදිය යුතුය.

**3 පියවර**

i. ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත අදාළ ලේඛනද සමග ලැබෙන සියලුම අයදුම්පත්‍ර පිටපත් 02කින් යුතුව ලබාගෙන PL/COC/02 ආකෘතියට අනුව සකස්කරන ලද C.R. ලේඛනයක තොරතුරු සටහන් කළ යුතුය.

ii. සෑම අයදුම්පත්‍රයකටම අංකයක් ලබා දිය යුතු අතර, එය පහත අනුපිළිවෙලට විය යුතුය.

දිස්ත්‍රික් අංකය/ ගො.සේ.ම. අංකය/ කෘ.ප.නි.ස. කොට්ඨාස අංකය/ ග්‍රා.නි. වසමේ අංකය/ යාය අංකය/ කැබලි අංකය/ අයදුම්පත්‍ර ලැබෙන අනුපිළිවෙළ අංකය

iii. ඉහත අංකය ලබා දීමේ දී කුඹුරු ඉඩම් ලේඛනය පරීක්ෂාකල යුතුය. කුඹුරු ඉඩම් ලේඛනයේ නොමැති කුඹුරක් නම් යාය අංකයට සහ කැබලි අංකයට "0" යෙදිය යුතුය.

iv. ඉහත පරිදි අයදුම්පත්‍රයට අංකයක් ලබා දී ලේඛනගත කිරීමෙන් පසු අයදුම්කරු වෙත ඉදිරි විමසීම් කටයුතු සඳහා එම අංකය ලබා දිය යුතුය.

v. අයදුම්පත්‍ර අංකයේ අවසාන කොටුවේ අංකය අදාල ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය විසින් සම්පූර්ණ කළ යුතුය.

## 4 පියවර

i. ලැබෙන සියලුම අයදුම්පත්‍ර පොල් වගාව සඳහා කුඹුරු ඉඩම් යෙදවීමට නිර්දේශ කිරීමේ කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය. එක් එක් කමිටුවක බල ප්‍රදේශය අදාළ ගොවිජන සේවා බල ප්‍රදේශය විය යුතුය.

ii. මෙම කමිටුව ගොවිජන සේවා මධ්‍යස්ථානයේ රැස්විය යුතු අතර කැඳවුම්කරු ලෙස ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී කටයුතු කළ යුතුය.

iii. මෙම කමිටුව පහත දෙපාර්තමේන්තු/ ආයතනවල නිලධාරීන්ගෙන් සමන්විය යුතු අතර අවම වශයෙන් කමිටුවේ ගණපූර්ණය පස්දෙනෙක් විය යුතුය. පහත **(අ)**, **(ආ)**, **(ඇ)** සහ **(ඈ)/ (ඕ)** හි සඳහන් නිලධරයන් අනිවාර්යය විය යුතුය.

(අ) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව - ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි

(ආ) පොල් වගා කිරීමේ මණ්ඩලය - පොල් සංවර්ධන නිලධාරි

(ඇ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - කෘෂිකර්ම උපදේශක

(ඈ) ඉඩම පිහිටි කොට්ඨාසයේ කෘ.ප.නි.ස.

(ඉ) මධ්‍යම පරිසර අධිකාරිය නියෝජනය කරන නිලධරයෙකු

(ඊ) ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව නියෝජනය කරන නිලධාරියකු

(උ) වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරන නිලධාරියකු

(ඌ) මීට අමතරව අදාළතාවය අනුව රජයේ දෙපාර්තමේන්තු, මණ්ඩල හෝ ව්‍යවස්ථාපිත ආයතනයක නිලධාරියකු

(ඔ) ගොවිජන සේවා කාරක සභාවේ සභාපති

(ඕ) ඉඩම අයත්වන ගොවි සංවිධානයේ සභාපති/ ලේකම්

iv. මෙම ප්‍රාදේශීය කමිටු පත් කිරීම හා අවශ්‍යතාව අනුව සංශෝධනය කිරීම දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් විසින් සිදුකළ යුතුය. ඉහත ආයතනවලට අමතරව අදාළතාවය අනුව වෙනත් යම් ආයතනයක නිලධාරීන් කමිටු සාමාජිකයන් ලෙස නම්කල හැකිය. එක් එක් ආයතනයෙන් විමසා එම ආයතන

ප්‍රධානියා විසින් නම් කරනු ලබන නිලධරයා වෙත ඔබ විසින් විධිමත් පත්වීම් ලිපියක් ලබාදිය යුතුය. විශේෂ හේතුවක් මත එම පත්වීම අවලංගු නොකළහොත් නිලධරයා එම තනතුර දරන කාලයට වලංගුවනු ඇත.

v. ප්‍රාදේශීය කමිටුව විසින් සෑම අයදුම්පත්‍රයක් සඳහාම නිර්දේශ ලබා දීමේදී මෙම චක්‍රලේඛයේ 3(i) හි සඳහන් නිර්ණායක පිළිබඳව සලකා බැලීම අනිවාර්ය වේ.

vi. ඉහතින් පත්කරන ලද කමිටුව විසින් එක් එක් අයදුම්පත්‍රය පිළිබඳ කරුණු සාකච්ඡා කර අවශ්‍යතාවය අනුව ස්ථානීය පරීක්ෂණයක් සිදුකර අයදුම්පත්‍රයේ 02 කොටස සම්පූර්ණ කළ යුතුය. යම් කුඹුරු ඉඩමක් සම්බන්ධයෙන් තාක්ෂණික නිලධාරියකුගේ වාර්තාවක් අවශ්‍ය අවස්ථාවක දී ඒ සම්බන්ධව කොන්දේසි යටතේ සඳහන් කළ යුතුය.

**5 පියවර**

i. පොල් වගාව සඳහා කුඹුරු ඉඩම් යෙදවීමට නිර්දේශ කිරීමේ කමිටුව විසින් නිර්දේශ කරනු ලබන සියලුම අයදුම්පත්‍ර අදාළ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි විසින් ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කල යුතුය.

ii. ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේ නිර්දේශය අයදුම් පත්‍රයේ 03 කොටසෙහි සම්පූර්ණ කළ යුතුය.

iii. ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේ නිර්දේශය සහිත අයදුම් පත්‍ර අදාළ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන් විසින් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් වෙත යොමු කළ යුතුය.

**6 පියවර**

i. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් වෙත ලැබෙන අයදුම්පත්‍ර ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් CR ලේඛනයක ඇතුළත් කළ යුතුය. මේ සඳහා PL/COC/03 ආකෘතිය භාවිතා කළ යුතුය.

ii. අයදුම්පත්‍ර අංකයේ අවසාන අංකය ගොවිජන සේවා මධ්‍යස්ථාන අනුව අංක 01 සිට ලැබෙන අනුපිළිවෙළින් අංක යෙදිය යුතුය.

iii. ප්‍රාදේශීය කමිටුව විසින් තාක්ෂණ නිලධරයකුගේ වාර්තාවක් ලබාගත යුතු බවට සඳහන් කර ඇති අවස්ථාවක එවැනි කුඹුරු ඉඩමක් සඳහා තාක්ෂණ නිලධාරී වාර්තාවක් ලබා ගත යුතුය.

iv. අයදුම්පත්‍රයට අදාල තොරතුරු, නිරීක්ෂණ, නිර්දේශ, කොන්දේසි සහ තාක්ෂණ නිලධාරි වාර්තාවෙහි සඳහන් කරුනු පිළිබඳව සෑහීමකට පත් විය නොහැකි අවස්ථාවන්හිදී ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් විසින් පෞද්ගලිකව අදාළ ඉඩම පරික්ෂා කිරීමෙන් පසුව අයදුම්පත්‍රයේ 04 කොටස සම්පූර්ණ කළ යුතුය.

v. ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේ නිර්දේශ සහිතව ඔබ වෙත ඉදිරිපත් කරනු ලබන ඔබගේ අනුමැතිය සහිත අක්කර 01 සහ ඊට අඩු කුඹුරු ඉඩම් වලට අදාල අයදුම්පත්‍ර සඳහා පුරන් කුඹුරු ඉඩමක පොල් වගා කිරීම සඳහා අවසරපත්‍රයක් නිකුත් කිරීම ඔබ විසින් සිදුකළ යුතුය. මේ සඳහා PL/COC/04 ආකෘතිය භාවිතා කළ යුතුය.

vi. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් විසින් නිර්දේශ කරනු ලබන අක්කර 01ට වඩා වැඩි පුරන් කුඹුරු ඉඩම් වලට අදාල අයදුම්පත්‍ර දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත ඔබ විසින් යොමු කළ යුතුය.

**7 පියවර**

i. දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත ලැබෙන අක්කර 01 ට වැඩි කුඹුරු ඉඩම් වලට අදාල අයදුම්පත්‍ර සඳහා දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ නිර්දේශය අයදුම්පත්‍රයේ 05 කොටසෙහි සඳහන් කල යුතුය.

ii. අක්කර 01ට වැඩි කුඹුරු ඉඩම් සඳහා දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ නිර්දේශය ලැබීමෙන් පසු අවසර පත්‍රය නිකුත් කිරීමේ ඉදිරි කටයුතු සඳහා ඔබ විසින් මා වෙත යොමු කළ යුතුය.

04. පොල් වගා කිරීම සඳහා අවසර ලබාදී ඇති කුඹුරු ඉඩමක් සම්බන්ධයෙන් 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ අදාළ සියලු විධිවිධාන බලාත්මක විය යුතුය.

05. පොල් වගා කිරීමට අවසර ලබාදෙන සෑම කුඹුරු ඉඩමක් සම්බන්ධයෙන්ම අදාළ තොරතුරු ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් **කෘෂිකාර්මික ඉඩම් ලේඛනය (අවසර සහිතව කුඹුරු ඉඩම්වල පොල් වගා කරන)**ක ඇතුළත් කළ යුතුය. එම ලේඛනය PL/COC/05 ආකෘතියට අනුව සකස් කළ යුතු අතර එම ලේඛනයෙහි සහ කෘෂිකාර්මික ඉඩම් ලේඛනයේ (කුඹුරු) පිටු අංකයේ සහ අනුක්‍රමික අංකයේ සම්බන්ධතාවය ලේඛන දෙකෙහිම සටහන් කළ යුතුය.

06. 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 38 (4),(5) වගන්තිය ප්‍රකාරව අක්කර 01 සහ ඊට අඩු පුරන් කුඹුරු ඉඩම් වල ඉහත ක්‍රමවේදයට යටත්ව පොල් වගා කිරීමට අවසර ලබා දීම සඳහා මා සතු බලතල මෙම චක්‍රලේඛය මගින් දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරුන් වෙත පවරමි.

07. මා විසින් නිකුත් කරන ලද 2021.01.01 දිනැති අංක 1/ 2021 දරන චක්‍රලේඛය අනුව කුඹුරු ඉඩම්වල ස්ථිර බෝග වගා කිරීම සඳහා අවසර ලබාදීමේ ක්‍රමවේදය පොල් වගාවට අදාළ කර නොගත යුතුය.

08. මෙම චක්‍රලේඛයෙහි සඳහන් කරුණු අවශ්‍යතාවය අනුව කලින් කලට සංශෝධනය කිරීම, අලුතින් කරුණු ඇතුළත් කිරීම, ඉදිරිපත් වන අභියාචනා සම්බන්ධයෙන් පරීක්ෂාකර ඒ අනුව තීරණ ගැනීම සහ ලබාදී ඇති අවසර පත්‍රයක බලය අවලංගු කිරීම පිළිබඳ පූර්ණ බලය ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් සතුවේ.

09. පොල් වගා කිරීමට අවසර ලබාදෙන සෑම කුඹුරු ඉඩමක් සම්බන්ධයෙන්ම අදාළ තොරතුරු ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් ඇතුළත්වන PL/COC/06 ආකෘතිය පරිදි සකස්කරනු ලබන සාරාංශ වාර්තාවක් මාසිකව මා වෙත ඉදිරිපත් කළ යුතුය.

10. ගෝලීය තිරසර සංවර්ධන ඉලක්ක හා අනුගත වෙමින් ශ්‍රී ලංකාවේ දුගී බව තුරන් කරමින් ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්ති වලට අනුව කෘෂිකාර්මික ඉඩම් කාර්යක්ෂමව හා ඵලදායීව යොදා ගැනීම සඳහා මෙම කාර්යය විධිමත් ලෙස සිදු කරන මෙන් කාරුණිකව දන්වමි.

ඒ.එච්.එම්.එල්. අබේරත්න
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

පිටපත් :

| | |
|---|---|
| 01. ජනාධිපති ලේකම් - ජනාධිපති ලේකම් කාර්යාලය | - කා.දැ.ගැ.ස. |
| 02. අග්‍රාමාත්‍ය ලේකම් - අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය | - කා.දැ.ගැ.ස. |
| 03. ලේකම් - කෘෂිකර්ම අමාත්‍යාංශය | - කා.දැ.ගැ.ස. |
| 04. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශකටයුතු අමාත්‍යාංශය | - කා.දැ.ගැ.ස. |
| 05. ලේකම් - කාබනික පොහොර නිෂ්පාදන ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවලු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන බීජ නිශ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය | - කා.දැ.ගැ.ස. |
| 06. ලේකම් - පොල්, කිතුල්, තල් හා රබර් වගා ප්‍රවර්ධනය හා කාර්මික භාණ්ඩ නිෂ්පාදනය හා අපනයන විවිධාංගිකරණ රාජ්‍ය අමාත්‍යාංශය | - කා.දැ.ගැ.ස. |
| 07. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් | - කා.දැ.ගැ.ස. |
| 08. විගණකාධිපති - ජාතික විගණන කාර්යාලය | - කා.දැ.ගැ.ස. |
| 09. අධ්‍යක්ෂ ජනරාල් - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | - කා.දැ.ගැ.ස. |
| 10. අධ්‍යක්ෂ ජනරාල් - වාරිමාර්ග දෙපාර්තමේන්තුව | - කා.දැ.ගැ.ස. |
| 11. සභාපති - පොල් වගා කිරීමේ මණ්ඩලය | - කා.දැ.ගැ.ස. |
| 12. සභාපති - ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව | - කා.දැ.ගැ.ස. |
| 13. සභාපති - මධ්‍යම පරිසර අධිකාරිය | - කා.දැ.ගැ.ස. |
| 14. සභාපති - නාගරික සංවර්ධන අධිකාරිය | - කා.දැ.ගැ.ස. |
| 15. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් | - කා.දැ.ගැ.ස. |